# දිගාසිරි ලැබීමේ රහස



විතානගේ මිසිනෝනා මහත්මිය -108 යි

පසුගිය දා ජපානයේ ලොව වඩාත්ම වයෝවෘද්ධ කාන්තාව ලෙස සැලකුණු යෝන් මිනගාවා අවුරුදු 114 ක් ආයු වළඳා පරලෝ සැපත්වූ බව මේ ඔක්තෝබර් ලංකාවිත්ති පත්‍රයේ ඇයගේ ඡායාරූපයක් සමග පළවී තිබුණේය. එවැනිම පුවතක් ශ්‍රීලංකාවේ අගලවත්තේ යටියන ගමේ කන්ද උඩගෙදර පදිංචිව සිටි පින්නගොඩ විතානගේ මිසිනෝනා උපාසිකාව පිළිබඳව වාර්තා කළ හැක. මිසිනෝනා මාතාව අවුරුදු 108 යි මාස 10 ක් ජීවත්ව මේ ඔක්තෝබර් 12 දා පරලෝසැපත් වූවාය.

ජීවත්ව සිටින කාලයේදී මිසිනෝනා මහත්මිය නිර්මාංශාහාර ගත් බවත් එසේම ආහාර ගැනීමේදී ඉතා අඩුවෙන් අවශ්‍ය ප්‍රමාණය පමණක් ගත් බවත්, සැමදෙනාටම එකසේ සලකමින් අනුන්ගේ දොස් නොසොයා බෞද්ධාගමික පිළිවෙත් අනුව කටයුතු කළ බවත් ඇගේ පවුලේ අය පවසති. මෙහි පළවන පින්තූරය එවන ලද්දේ මිසිනෝනා මහත්මියගේ පුතණුවන් වන ගුවන් යානා ඉන්ජිනේරු ලක්ෂමන් මාකාවිට මහතා විසිනි.

ශ්‍රීලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳව අවුරුදු කීපයකට පෙර පැසුණු සිතේ විවේකය (පැසිවිය) නම් රූපවාහිනී වැඩසටහන මෙහෙයවූ ආචාර්ය ලීල් ගුණසේකර මහතා මෙම මිසිනෝනා මහත්මියද එයට සහභාගිකරවා ගත්තේය. එම සාකච්ඡාවේදී එතරම් කලක් ජීවත්වීමේ රහස කුමක්දැයි විචාල විට ඇයගේ පිළිතුර වූයේ ඉහතින් සඳහන් කළ ජීවන පිළිවෙල මෙන්ම, ඇගේ උගුරේ කිසිවිටක යමක් හිරවී නැති බවයි. එනම් ඇය කිසිවෙකුට ඊර්ෂ්‍යා නොකළ බවයි.

වෘද්ධවිද්‍යාව (Gerontology) පිළිබඳ විශේෂඥයෙකු වූ ලීල් ගුණසේකර මහතා මේ පිළිබඳව විවිධ ප්‍රවනතා දක්වමින් මෙසේ කියයි.

" ලෝකයේ ඉතාම වැඩි කලක් ජීවත්වන පුද්ගලයින් ඉන්නේ ජපන් රටේ. ඊළහට ශ්‍රීලංකාවේ අය වැඩි කලක් ජීවත් වෙනව. ඒ අතරින් කාන්තා පක්ෂය පිරිමි පක්ෂයට වඩා දීර්ඝ ආයුෂ ඇත්තෝයි. ශ්‍රීලංකාව වැනි පෙරදිග රටවල තරුණ පරම්පරාව තම වැඩිහිටියන් ආදරයෙන් රැකබලා ගන්නවා. තමන් වෙනුවෙන් විවිධ ලෙස දුක් ගැහැට විඳිමින් දරු ප්‍රේමයෙන් සැලකූ වැඩිහිටියන් ගෞරවාදරයෙන් රැක බලාගැනීම චිරාගත අපේ සම්ප්‍රදායයි."

දැනට ශ්‍රීලංකාවේ වයස 60 ට වැඩි ඇය සියයට 10 ටත් වැඩි බවත්, 2030 වන විට එම ගණන සියයට 15 ටත් වැඩිවන බවත් දැනට ශ්‍රීලංකාවේ 98% වැඩිහිටියන් බලාගැනීම විශේෂයෙන් සිද්ධවන්නේ තමන්ගේ දූ දරුවන් විසින් බවත් ආචාර්ය ලීල් ගුණසේකර මහතා සඳහන් කරයි. මෙම අන්තර් පරම්පරා කෘතඥපූර්වතාව විශේෂයෙන් අගය කළ යුතු බවත්, එම ආදර්ශයේ ප්‍රතිපලයක් ලෙස මිසිනෝනා මහත්මියට දීර්ඝායුෂ ලැබුණු බව සැලකිය හැකි බවත් ඔහු වැඩිදුරටත් පවසයි.

♦ **විස්කම් සෙනෙවිරත්න** Sri Lanka

# සෝම හිමි ගුණ සැමරුම්



2003 දෙසැම්බර් 12 වෙනි දින පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන් අකාලයේ අපවත් වී වදාළේ මුළුමහත් ශ්‍රීලංකාවේ බෞද්ධ හා අබෞද්ධ ජනතාවගේ දෑස්වලට උණු කඳුළු නංවමිනුයි. විචිත්‍ර ධර්ම කථිකයාණන් කෙනෙකු වූ උන්වහන්සේ අප දේශය හා ජාතිය අද දවසේ වැටී සිටින නිවට නියාළු තත්වයෙන් හා දුශ්චරිතයෙන් මුදවාගෙන ඔවුන් ධීර නිවහල් ජනතාවක් කරන්නට ඉමහත් වෙර දැරූ සුපේශල දහම්ධර යතිවරයාණන් කෙනෙක්.

අප දැයට වූ පාඩුව මෙතෙකැයි කියන්නට බැරි තරම්. මේ දරුණු ආන්තරා බහුල සමයේ අපට ධෛර්‍යය එළිය දුන් පහන නිවීයෑම අපේ ම අභාග්‍යයි.

සෝම හාමුදුරුවන්ට උතුම් නිවන් සැප අත්වේවා !

*විකුම් පෑ සුරු විරුව ඒ කල අතීතේ*
*සිහල දැය අද නිවට වී ඇයි දැයි කියා*
*සොයා කාරණ දෙසා බණපද මියුරු වූ*
*නැගූ උන් හද බුදු පුතෙකි ඔබ නම් උතුම්*

♦ **වෙනුර**

# අපි මුතුඇටයේ දරුවෝ

**එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රීලංකා ජනතා සහයෝගිත්වයෙන් යුතුව ලන්ඩනයේ ශ්‍රීලංකා මහ කොමසාරිස් කාර්‍යාලය ඉදිරිපත් කරන**

## සංස්කෘතික සංදර්ශණය

**2007 දෙසැම්බර් 15 වෙනි සෙනසුරාදා සවස 6 ට**

තැන - **The Great Hall, Imperial College, Exhibition Road, South Kensington, London SW7 2AZ**






## වර්ෂ පූර්ණ සිහිකිරීමයි

කවියෙකු හා ලේඛකයෙකුව සිටි

***සිරිසෝම හරිශ්චන්ද්‍ර මහතා***

**වියෝවී මෙම දෙසැම්බර් මාසයේ 17 වෙනි දින දෙවසරක් සපිරේ. එතුමන් ආදරයෙන් සමරන්නේ හරිශ්චන්ද්‍ර පවුලේ අය සහ ලන්ඩනයේ හිතමිත්‍රාදීන්**

